# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1934/17 - 2015 සැප්තැම්බර් මස 30 වැනි බදාදා - 2015.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(460 වැනි අධිකාරය)**

**ඉඩම් අත්කර ගැනීමේ පනත**

මගේ අංකය : 4/3/1(පත්කිරීම් - අත්කර ගැනීම්)

460 වන අධිකාරය මත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2)අ වගන්තිය යටතේ ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් නියෝගය මෙයින් නියම කරමි.

**නියෝග අංක 2015/09 - පත්කිරීම්**

මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මාර්ග ව්‍යාපෘති සඳහා ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම පිණිස I වන උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශය තුළ II වන උපලේඛනයේ දක්වා ඇති නිලධාරියා III වන උපලේඛනයේ දක්වා ඇති කාලසීමාව දක්වා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කාර්ය සඳහා නියමිත නිලධාරියකු ලෙස මෙයින් නියම කරනු ලැබේ.

| *I වන උපලේඛනය* | *II වන උපලේඛනය* | *III වන උපලේඛනය* |
|---|---|---|
| *පරිපාලන දිස්ත්‍රික්කය* | *නිලධාරියාගේ නම* | *කාලසීමාව* |
| කොළඹ, ගම්පහ, කළුතර | ඩී. එම්. දයාරත්න මහතා<br>(ඉංජිනේරු සේවාවේ විශේෂ ශ්‍රේණිය) | 2015.07.07 දින සිට<br>නැවත නියමයක් කරන තුරු |

ඇම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,<br>ඉඩම් අමාත්‍ය.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,<br>ඉඩම් අමාත්‍යාංශය,<br>"මිහිකත මැදුර", අංක 1200/6,<br>රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

10 - 576/1

1A - G 22392 — 46 (2015/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(460 වැනි අධිකාරය)**

**ඉඩම් අත්කර ගැනීමේ පනත**

මගේ අංකය : 4/3/1(පත්කිරීම් - අත්කර ගැනීම්)

460 වන අධිකාරය මත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2)අ වගන්තිය යටතේ ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් නියෝගය මෙයින් නියම කරමි.

**නියෝග අංක 2015/10 - පත්කිරීම අවලංගු කිරීම**

2011.11.28 දිනැති අංක 1734/11 දරන ගැසට් නිවේදනය මගින් I වන උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශය තුළ II වන උපලේඛනයේ දක්වා ඇති නිලධාරියා 2011.08.25 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කාර්ය සඳහා නියමිත නිලධාරියකු ලෙස කරන ලද පත්වීම III වන උපලේඛනයේ දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලැබේ.

| *I වන උපලේඛනය* | *II වන උපලේඛනය* | *III වන උපලේඛනය* |
|---|---|---|
| *පරිපාලන දිස්ත්‍රික්කය* | *නිලධාරියාගේ නම* | *කාලසීමාව* |
| කොළඹ, ගම්පහ, කළුතර | එස්. ඕපනායක මහතා (ඉංජිනේරු සේවාවේ විශේෂ ශ්‍රේණිය) | 2015.07.07 දින සිට |

ඇම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

10 - 576/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.